මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| සිංහල භාෂාව හා සාහිත්‍යය | 9 ශ්‍රේණිය | කාලය : පැය 02යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ...........................................................................................................

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසෙහි 1 හා 2 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි කොටසෙහි අර්ථය ඇති පිළිතුර තෝරන්න.

1) ජයදේව <u>දිවදෙකේ</u> මිනිහෙක් බව ඔහුගේ පියා පැවසීය.

   (1) විශ්වාසය තැබිය හැකි අයෙක් (2) විශ්වාසය නැති මිනිහෙක්

   (3) අශෝබන මිනිහෙක් (4) ඉතා අලංකාර මිනිහෙක්

2) එම සංස්ථා සභාපතිවරයා තමන්ගේ හැකි කම් ගැන කියමින් <u>පාරම්බෑවේය.</u>

   (1) විස්තර කළේය. (2) ඝෝෂා කළේය.

   (3) පුළුවන්කාරකම් කීවේය. (4) මුරුංගා ගසට නංගේය.

3) උදව් කළ අය අමතක කර වෙනත් අය පැසසීම , අනුන් මුළා කිරීම යන අරුත් ඇති ප්‍රස්තාවපිරුළ හා ඉඟි වැකිය ඇතුළත් පිළිතුරු යුගලය වන්නේ,

   (1) ගින්නක් නැතිව දුමක් නොනගී. (2) ගඟෙන් වතුර බී මුහුදට ආවඩන්නාසේ

   (3) සුදු ලූනු පොඩි කිරීම. (4) කිඹුල් කඳුළු හෙළීම.

   (1) 1 හා 3 ය. (2) 2 හා 3 ය. (3) 1 හා 4 ය. (4) 3 හා 4 ය.

4) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

   (1) මිහිරි - ප්‍රණීත , මියුරු , මධුර , රසවත්

   (2) පුබුදු - විකසිත , මිණිමුතු , පිපි , මුකුලිත

   (3) කෙට්ටු - කෘෂ , කැහැටු , කේඩෑරි , වැහැරුණු

   (4) උපදේශය - අවවාදය , අනුශාසනය , දැනමුතුකම , ඔවදන

5) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරන්න.

   (1) රමණිය , උළෙල. (2) ඇතුළත , ශිෂ්‍ය.

   (3) දියුනුව , ගැහැණියක. (4) ආස්වර්යය , කෙකිනි.

6) "මූර්ධජ" අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

   (1) ත , ථ , ධ , ද, න (2) ප , ඵ , බ , භ , ම

   (3) ට , ඨ , ඩ , ඪ , ණ (4) ක , ඛ , ග , ඝ , ඞ

7) අකාරාදී පිළිවෙළට නම් යෙදී ඇති නිවැරදි පිළිතුර තෝරන්න.

(1) අම්පාර , ඉඹුලාන , උහන , බලංගොඩ , කළුතර

(2) ඉඹුලාන , අම්පාර , බලංගොඩ , උහන , කළුතර

(3) අම්පාර , ඉඹුලාන , උහන , කළුතර , බලංගොඩ

(4) අම්පාර , උහන , ඉඹුලාන , කළුතර , බලංගොඩ

8) "ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර"

ඉහත කවියෙන් දැක්වෙන වාක්‍ය අලංකාර වන්නේ,

(1) උපමාලංකාරයයි. (2) අනුප්‍රාසයයි.

(3) උත්ප්‍රේක්ෂාලංකාරයයි. (4) ධ්වනිතාර්ථයයි.

9) ධීවර භාෂාවේ කාලගුණය හැඳින්වෙන්නේ,

(1) මාරියාව නමිනි. (2) ඉයත්තුව නමිනි.

(3) වළාල නමිනි. (4) හරාව නමිනි.

10) "ශිෂ්‍යයෝ මහධන සිටුපුත් <u>වත</u> ශ්‍රැතිගෝචර ශෛලියෙන් ඉදිරිපත් කළහ."

(1) මුහුණ (2) කතා පුවත (3) වස්ත්‍රය (4) වස්තුව

11) "පුළුන් වලා වියන යටින් - හඳ මාමා එබිකම්කොට

හැන්දෑවට හිනැහෙනකොට - අහස ලස්සනයි " යනුවෙන් කියැවෙන්නේ,

(1) උදය කාලයක් ගැනය (2) දවල් කාලයක් ගැනය

(3) වලාකුළු ගැනය (4) රාත්‍රී කාලයක් ගැනය

12) පද දෙකම සමානාර්ථ දෙන පද යුගලය තෝරන්න.

(1) එහෙන් මෙහෙන් (2) අවි ආයුධ (3) බාරහාර (4) මුදල් හදල්

13) තනි පෙරළි කොමා දෙක සහ ප්‍රශ්නාර්ථ ලකුණ නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) 'රන් දෝලි පෙරහැර' යනු කුමක්ද?

(2) 'රන් දෝලි' පෙරහැර යනු? කුමක්ද?

(3) රන් දෝලි පෙරහැර? ' යනු කුමක්ද'

(4) 'රන් දෝලි පෙරහැර' යනු, කුමක්ද?

14) යමෙකු හෝ යමක් සිහිපත් කිරීම යන්නට දිය හැකි තනි පදය වන්නේ,

(1) ස්මරණය (2) අනුස්මරණය (3) මතකය (4) සිහි කැඳවීම

15) විධික්‍රියා පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) යන්න , සිතනු , දෙම්වා (2) යවු , අස , දෙනු , මැනවි

(3) කියව , කියන්න , කරත්වා (4) වැටියන් , වෙත්වා , කියාපිය

- පහත 16 – 18 වාක්‍යවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

16) ..................................චාරිකාවට සහභාගි වූහ.

(1) ළමයින් සියල්ලන්ම (2) ළමයි සියල්ලෝම

(3) ළමයි සියල්ලන්ම (4) ළමයින් සියල්ලෝම

17) කුඩා දරුවා දියේ පාවෙද්දී..................................ජංගම දුරකථනය මඟින් ඡායාරූප ගත්හ.

(1) ඇතමකු (2) ඇතමුන් (3) ඇතමෙකු (4) ඇතමෙක්

18) රටේ ජාතික සම්පතක් වූ පුරාවස්තු විනාශවීම..................................සිද්ධියකි.

(1) සාමාන්‍ය (2) රමණීය (3) ඛේදනීය (4) සුළු

19) ළදරු කව් මී , නැළවිල්ල , ඔවාමුතුදම , වෙසක් පහන යන සාහිත්‍ය නිර්මාණ රචනා කළ ලේඛකයින් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කුමාරතුංග මුනිදාස , ආනන්ද රාජකරුණා , සිබිල් වෙත්තසිංහ , ඇස් මහින්ද හිමි.

(2) ඇස් මහින්ද හිමි , සිබිල් වෙත්තසිංහ , ආනන්ද රාජකරුණා , කුමාරතුංග මුනිදාස.

(3) ආනන්ද රාජකරුණා , කුමාරතුංග මුනිදාස , ඇස් මහින්ද හිමි , සිබිල් වෙත්තසිංහ.

(4) සිබිල් වෙත්තසිංහ , ආනන්ද රාජකරුණා , ඇස් මහින්ද හිමි , කුමාරතුංග මුනිදාස.

20) පෙළපොතින් උපුටාගත් පහත සඳහන් ප්‍රකාශ අයත්වන පාඩම් පිළිවෙල දක්වා ඇති පිළිතුර තෝරන්න.

'මෙතෙක් රන් දීලා මල් ගෙනෙව'

"පුතේ , මම බෙරේ දාගෙන හැතැප්ම ගණන් පයින් ගිය කෙනෙක්"

"මැණියනි , මම ඔබ ශ්‍රී පාදයට කැඳවාගෙන යමි."

"ඒ මොහොතෙහි සිටැ මැ එයට පොහොසත් වන්නට උත්සහ කළම්හ"

(1) දේශීය නර්තනයේ රන් සලකුණ, මහධන සිටුපුත්හුගේ වස්තුව, ශ්‍රී පාදය වැන්ද වූ හැටි , උගැන්නැ සියබස මත් වන්නැ එහි රසයෙන්.

(2) මහධන සිටුපුත්හුගේ වස්තුව, දේශීය නර්තනයේ රන් සලකුණ, ශ්‍රී පාදය වැන්ද වූ හැටි, උගැන්නැ සියබස මත් වන්නැ එහි රසයෙන්.

(3) ශ්‍රී පාදය වැන්ද වූ හැටි, මහධන සිටුපුත්හුගේ වස්තුව, දේශීය නර්තනයේ රන් සලකුණ, උගැන්නැ සියබස මත් වන්නැ එහි රසයෙන්.

(4) උගැන්නැ සියබස මත් වන්නැ එහි රසයෙන්, දේශීය නර්තනයේ රන් සලකුණ, ශ්‍රී පාදය වැන්ද වූ හැටි, මහධන සිටුපුත්හුගේ වස්තුව.

## II කොටස

- පළමු හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) පන්තියේ ඇගයීමක් ලෙස සකස් කළ පදා සංග්‍රහය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

(1) ඔබ පදා සංග්‍රහයට ඉදිරිපත් කළ නිර්මාණයේ මාතෘකාව කුමක්ද? (ල. 02)

(2) ඔබේ නිර්මාණය සකස් කිරීමේදී ඔබට ගුරුවරයාගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ල. 04)

(3) නිර්මාණය සකස්කර ගැනීම සඳහා ඔබ අනුගමනය කළ ක්‍රියා මාර්ග දෙකක් ලියන්න. ( ල. 04)

(4) නිර්මාණය සැකසීමේදී ඔබ මුහුණ දුන් ගැටළු දෙකක් ලියන්න. (ල. 02)

(5) නිර්මාණය සකස්කිරීමෙන් ඔබට ලැබුණු හැකියා දෙකක් ලියන්න. (ල. 04)

02) පහත සඳහන් අ, ආ, ඇ, ඉ, උ යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

(අ) පරිසරය සුන්දරව හා පිරිසිදුව තබා ගන්නට අප වෙහෙසෙන විට පරිසරය ද අප නීරෝගීව තබන්නට වෙහෙසෙයි. පරිසරයට මුදාහරින අපද්‍රව්‍ය නිසා අහිංසක සතුන් මරණයට පත්වන්නේ ඛේදනීය ආකාරයකටය. අද ජීවත්වන සතුන් අනාගතයේදී වඳවී යාමට ඇති ඉඩකඩ බෝහෝය.**"පරිසරය රකිමින් අපිත් රැකෙමු"** මාතෘකාවෙන් රචනයක් ලියන්න.

(ආ) අධික වේගයෙන් රිය පැදවීම , නොසැලකිලිමත් බව, නීතිය හරි හැටි ක්‍රියාත්මක නොවීම,මාර්ග සංඥා පිළිබඳ රියදුරන්ගේ හා මගීන්ගේ නොදැනුවත්කම, ජංගම දුරකථන භාවිතා කරමින් ගමන් කිරීම හා රිය පැදවීම මේ ආදී බෝහෝ කරුණු නිසා මාර්ග අනතුරු වැඩිවී ඇත. **"මාර්ග අනතුරු අවම කරමු"** මාතෘකාවෙන් රචනයක් ලියන්න.

(ඇ) ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය බවට පත්වීමේ රහස පැරණියන්ගේ වාරිශිල්ප ඥානයයි.ඒ මඟ යමින් කෘෂිකාර්මික අංශය දියුණු කරලීමෙන් අපේ රට යළි ස්වයංපෝෂිත දේශයක් කළ හැකිය. ඒ සඳහා කළ යුතු දේ බෝහෝය. **"කෘෂිකර්මයෙන් රට පෝෂණය කරමු"** මාතෘකාවෙන් රචනයක් ලියන්න.

(ඉ) මව්පියන් දරුවන් රැකබලා ගන්නේ තම දෑසමෙනි. සිරිත් විරිත්,ගුණ දහම් හා නැණ නුවණින් පිරිපුන් දරුවෙකු සමාජයට දයාද කිරීම ඔවුන්ගේ එකම පැතුමයි. එහෙත් ඇතැම් දරුවන් ඉහළ රැකියාවලට ගොස් ගුණදම් සිරිත් විරිත් අමතක කරයි. එයින් අසරණ වන්නේ දෙමව්පියේය. **"දෙමව්පියන්ට සැලකීමේ වැදගත්කම"** මාතෘකාවෙන් රචනයක් ලියන්න.

(උ) ගෝලීය වසංගතයක් ලෙස පැමිණි කොරෝනා වසංගතය නිසා මුළු ලෝකයෙහිම සියලු කටයුතු අඩපණ විය. බෝහෝ ජනතාව ආර්ථික අපහසුතාවනට මුහුණ පෑහ. අපේ රටේ ජනතාවද දැඩි පීඩාවන්ට ලක් වූහ. රට නැවත යථා තත්වයට පත් කළ යුතුය. පත් විය යුතුය. **"යලි උපදින රට"** මැයෙන් රචනාවක් ගොඩනගන්න.

03) දිනය :- 2020.07.30

වේලාව :- පෙ.ව. 09.00

ස්ථානය :- විද්‍යාලීය ශ්‍රවණාගාරය

ප්‍රධාන අමුත්තා :- කිවිපති සාහිත්‍යශූරි කුමාර බස්නායක මැතිතුමා.

ඉහත තොරතුරු සම්බන්ධකර ගනිමින් ඔබ පාසලේ පැවත්වීමට සූදානම් කර ඇති කුමාරතුංග මුණිදාස ගුණ සමරු උත්සවයට දෙමව්පියන් සම්බන්ධ කර ගැනීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න. (ල. 10)

04) පහත දැක්වෙන පද්‍ය හා ගීත ඛණ්ඩයේ ඉතිරි කොටස් සම්පූර්ණ කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) (1) වදා වඩා රස කිරි දී ඇති කළ දැයි පෙම් නේ
අඬා විඩා හැර පලවැල ගෙන දුන්දැයි නිති නේ
..............................................................................................
.............................................................................................. (ල. 04)

(2) මෙම පද්‍ය ඇතුළත් කාව්‍ය නිර්මාණය නම් කරන්න. (ල. 01)

(ආ)(3) කෙලෙස් මල පිරි නුවරඅතහැර
බවුන් වඩනට වනේ වැඩි ඔබ
..............................................
.............................................. (ල. 04)

(4) ඉහත ගීත ඛණ්ඩයේ රචකයා නම් කරන්න. (ල. 01)

05) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පිරවීමට යෙදිය හැකි නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරන්න.

(1) සමනල්ලු පියාසර.................................... (කරයි , කරති)

(2) ඇතැමෙක් සතුටින්.................................. (නයති , නටයි)

(3) කිකිළිය පැටවුන් කැටිව ආහාර................................ (සොයයි , සොයති)

(4) තුරුලතා පවනින් කම්පා.................................. (වෙති , වෙයි)

(5) දෙමාපියෝ දරුවන්.................................... (සුරකියි , සුරකිති)

(ල. 2×5=10)

06) පහත දී ඇති වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට හරවන්න.

(1) මව දරුවා නැළවුවාය.

(2) ධීවරයෝ මත්සයන් අල්ලති.

(3) විදුහල්පතිතුමා ශිෂ්‍ය නායකයන් ඇමතීය.

(4) ගොවියා පැසුණු කුඹුර බලයි.

(5) යුද සෙබළු සතුරන් ලුහුබැන්දහ.

(ල. 2×5=10)

07) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුර යුගයේ ආරම්භයේ සිටම ශ්‍රී ලංකාව වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් පැවතිණි. ඇතැම් ඉතිහාසඥයන් ප්‍රකාශ කරන අන්දමට ඉන්දු ආර්යයන් ශ්‍රී ලංකාවට මුලින් පැමිණ ඇත්තේද වෙළඳ කටයුතු සඳහාය. වයඹ දිග වෙරළේ කිමිද ගනු ලැබූ මුතුද උතුරේ මුහුදෙන් ලැබුණු සක්බෙල්ලන්ද ශ්‍රී ලංකාවට පැමිණ වෙළඳ නැව්වලින් ගෙන ගිය ප්‍රධාන ද්‍රව්‍ය වන්නට ඇත. එහෙත් බටහිර හා දකුණේ නැව් තොටුවලට එන්නට වෙළඳ නැව් වලට මඟ පෙන්වූ ධ්‍රැව තාරාකාව වන්නට ඇත්තේ දකුණේ කඳුකර ප්‍රදේශවලින් ලැබුණු මැණික්ය. ශ්‍රී ලංකාවට “රත්නදීප” යන නම ලැබුණේද මැණික් නිසාමය ඇතුන් හා ඇත්දත් ආදිය ලංකාවෙන් පිටරට යවන ලද වෙනත් භාණ්ඩ අතර විය.

(1) ඉන්දු ආර්යයන් ශ්‍රී ලංකාවට පැමිණියේ කුමක් සඳහාද?

(2) ශ්‍රී ලංකාවට පැමිණි වෙළඳ නැව්වලින් ගෙන යන ලදැයි අනුමාන කළ හැකි ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.

(3) “රත්නදීප” යන නම ශ්‍රී ලංකාවට ලැබුණේ ඇයි?

(4) ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ වෙනස් භාණ්ඩ දෙකක් නම් කරන්න.

(5) පහත සඳහන් වචන සඳහා සමාන පද ලියන්න.

(අ) ප්‍රචලිත. (ආ) රත්න.